මගේ අංකය: JSC/SEC/CIR/2021

**සියළුම අධිකරණ නිලධාරීන් වෙත**

**<u>අධිකරණ මගින් විසදීමට වෙනත් නඩු ඇති රැඳවියන් එළිමහන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීම සම්බන්ධව</u>**

ශීර්ෂගත කරුණට අදාළව අධිකරණ අමාත්‍යාංශය හරහා අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ටී.අයි. උඩුවර මහතාගේ අංක: **කේ 08/අධිකරණ නියෝග/2021** හා 2021.10.11 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපිය ඔබගේ අවධානයට ලක් කිරීමට මට නියම කර ඇත.

2021.10.11 දිනැති ලිපියේ පිටපතක් මේ සමග අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

**එච්. සංජීව සෝමරත්න**
**ලේකම්**
**අධිකරණ සේවා කොමිෂන් සභාව**
**කොළඹ 12**

2021 නොවැම්බර් මස 24 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය.

# බන්ධනාගාර මූලස්ථානය
## சிறைச்சாலைத் தலைமையகம்
## PRISON HEADQUARTERS

150, බේස්ලයින් පාර, කොළඹ 09.  150, பேஸ்லைன் வீதி, கொழும்பு 09.  150, Baseline Road, Colombo-09.

| දුරකථන<br>தொலைபேசி<br>Telephones | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 2695204<br>4677177 | කොමසාරිස් ජනරාල්<br>ஆணையாளர் நாயகம்<br>Commissioner General | 2691976 | කොමසාරිස්<br>ஆணையாளர்<br>Commissioner | 2695221<br>2692818 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 2695206<br>4677180 |
|---|---|---|---|---|---|---|---|---|


මගේ අංකය / எனது இல. / My No: ගෙ 08/අධිකරණ නියෝග/2021

ඔබේ අංකය / உமது இல. / Your No:

දිනය / திகதி / Date: 2021-10-11

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12.

ලේකම් මගින්,
බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශය.

**<u>ගරු අධිකරණ මගින් විසදීමට වෙනත් නඩු ඇති රැඳවියන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීම සම්බන්ධයෙනි.</u>**

උක්ත කාරණය සම්බන්ධයෙන් කළුතර බන්ධනාගාර අධිකාරී මගින් මා වෙත යොමු කර ඇති අංක:- කළු/බන්ධ/ලිපි/2021 හා 2021-10-08 වන දිනැති ලිපිය හා සබැඳේ.

කළුතර බන්ධනාගාර අධිකාරී විසින් මා වෙත වාර්තා කර ඇති පරිදි විවිධ අධිකරණ මගින් විසදීමට වෙනත් නඩු ඇති රැඳවියන් පුනරුත්ථාපනය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් එළිමහන් සිර කඳවුරුවල පිහිටි පුනරුත්ථාන කටයුතු සිදු කරන කඳවුරු සඳහා මාරු කරන ලෙසට නියෝග කර ඇති බවත් ඔවුන් ඒ සඳහා මාරු කිරිමේදි විවිධ ගැටළු වලට මුහුණදීමට සිදුවන බවට දන්වා ඇත.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් පුනරුත්ථාපන කටයුතු සිදු කරනු ලබන වීරවිල, කල්දෙන වැනි කඳවුරුවල රැඳවියන් එළිමහන් වැඩ සඳහා යෙදවීමට කටයුතු කරන අතර, ඒ අතරතුර පුනරුත්ථාපන වැඩසටහන්, උපදේශණ වැඩසටහන් සහ ආගමික වැඩ සටහන් සඳහා යොමු කරනු ලබයි. මෙසේ කම්බි වැටකින් පමණක් වටවූ සීමාවන් තුල රැඳවියන්ට පැනයාමට ඇති අවස්තා වැඩි බැවින්, එම කඳවුරු සඳහා යොමු කිරීමේදි යම් උපරිම දඬුවම් කාල සීමවක් තුල විසදීමට වෙනත් නඩු නොමැති රැඳවියන් යොමු කිරීමට කටයුතු කරනු ලබයි , බන්ධනාගාර නීති රීති තුල වෙනත් නඩු ඇති සිරකරුවන් කඳවුරු සඳහා යොමු කිරිමට ප්‍රතිපාදන නොමැති බවට කාරුණිකව වාර්තා කරමි.

එබැවින් පානදුර ගරු මහෙස්ත්‍රාත් අධිකරණය මගින් ලබා දී ඇති නියෝග පිටපත් මේ සමඟ අමුණා ඇති අතර, ඉහත කරුණු සම්බන්ධයෙන් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර විසදීමට වෙනත් නඩු ඇති රැඳවියන් පුනරුත්ථාපන කඳවුරු සඳහා යොමු කිරීමට ගරු අධිකරණ මගින් ලබා දෙන නියෝග සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව හරහා සියළුම මහේස්ත්‍රාත්තුමන්ලා දැනුවත් කිරිමට අවශ්‍ය කටුයතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ටී.අයි. උඩුවර,
අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

**ටී.අයි. උඩුවර**
**අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය**